# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1967/6 - 2016 මැයි මස 16 වැනි සඳුදා - 2016.05.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ යොමු අංකය: අඹකෝ/3/1/අ/143-v
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/7/2013/එච්ඩබ්ලිව්/577.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

නුවරඑළිය දිස්ත්‍රික්කයේ, අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹගමුව කෝරළේ සුළු කොට්ඨාසයේ, කුඩාඔය ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2015.07.30 දිනැති අංක මු.පි.නු. 3014 දරන මුලික පිඹුරු කැබලි අංක 01 වශයෙන් දැක්වෙන කුඩාඔය වත්ත නමැති ඉඩමේ මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.0145ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටසට මායිම් -

**කැබලි අංක – 01**

ඉඩමේ නම: කුඩාඔය වත්ත; හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය: පී. කේ. සී. එස්. කුමාර, අංක 06, නුවරඑළිය පාර, කුඩාඔය, හැටන්; ප්‍රමාණය: හෙක්ටයාර්: 0.0145.

මායිම්:

උතුරට: මාර්ග (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ මු.පි.නු. 2786 හි කැබලි අංක 92; නැගෙනහිරට: මාර්ග (මාර්ග සංවර්ධන අධිකාරිය); මු.පි.නු. 2786 හි කැබලි අංක 93; දකුණට: මාර්ග (මාර්ග සංවර්ධන අධිකාරිය), මු.පි.නු. 2786 හි කැබලි අංක 93 හා හි.පි. 45509 හි කොටසක්; බටහිර: හි.පි. 45509 හි කොටසක් හා මාර්ගය.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලයලත් අයවළුන් හෝ 2016 ජූලි මස 13 වැනි දින පෙ.ව. 10.00ට, අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2016 ජූනි මස 29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවය, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. හිමිකම් පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

ආර්. ටී. පී. සුමනසේකර,
ප්‍රාදේශීය ලේකම්,
අඹගමුව කෝරළය,
ගිනිගත්හේන.

2016 මැයි මස 11 වැනි දින,
අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06 - 02

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 23453 - 22- (2016/05)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.